**පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2018**

**----------------------------------------------------------------------------------------------------**

**පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 මැයි 08 දින එළඹි අංක එස්.ආර්.අයි 43576 දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) (ii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව**

**ව්‍යාපෘති ගිවිසුම අනුව, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්ති සැපයුම ඉහළ නැංවීම සහ විදුලිය බෙදාදීමේ කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 200 කට සමාන රු.මිලියන 25,240 ක් සමාන වන අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 131.50 කට සමාන රු.මිලියන 16,595.30 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදීමට එකඟ විය. ඉතිරි මුදල වන රු.මිලියන 8,644.7 ක් ලංකා විදුලබල මණ්ඩලය විසින් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් 30 දින වන විට එහි කටයුතු ආරම්භ කර ඇති අතර එය 2017 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය කටයුතු නිම කිරීමේ දිනය 2019 ජුනි 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී.**

**1.3 තත්ත්වාගණනය කළ මතය**

**මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යැමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා වලට අනුව රු.මිලියන 14,292.75 ක් මෙම ව්‍යාපෘතිය මඟින් 2018 දෙසැම්බර් 31 දින වන විට වියපැහැදම් කර තිබුණි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 13,962,63 ක් වියපැහැදම් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ වටිනාකම අඩුවෙන් දැක්වේ. | අදහස් දක්වා නොමැත. | සියළුම වියපැහැදම් නියමිත වේලාවට සටහන් කල යුතු අතර කාලානුරූපව අදාල වාර්තා සැකසිය යුතුය. |

## 3. භෞතික ප්‍රගතිය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ලබාදී ඇති තොරතුරු වලට අනුව ව්‍යාපෘතිය කොටස් 07 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ අතර ව්‍යාපෘතියේ 01 වන කොටස සිට 04 වන කොටස දක්වා ක්‍රියාත්මක කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය සිදුකරයි. ව්‍යාපෘතියේ 04 වන කොටසේ යටතේ වැඩ කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විට සැලකිය යුතු ලෙස අවසන් කර තිබුණි. ව්‍යාපෘතියේ 01 වන කොටස සිට 03 වන කොටස දක්වා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| | විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ 01 වන කොටස යටතේ මන්නාරම ග්‍රිඩ් උපපොල ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 වන විට, ලඟාකර ගත යුතු ඉලක්කය සියයට 76 ක් වුවත්, වැඩ වල විෂය පථය වෙනස්කිරීම් හේතුවෙන් සියයට 42 ක් ලෙස පැවතුණි. | පාර්ශවකරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ කාලෝචිතව නොලැබීම. | අදහස් ලැබී නොමැත. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලබන යාන්ත්‍රණය ශක්තිමත් කල යුතුය. |
| (ආ) | තුල්හිරිය- කෑගල්ල, පොල්පිටිය - නව පොල්පිටිය , අතුරුගිරිය - පාදුක්ක සහ කොලොන්නාව යන සම්ප්‍රේෂණ මාර්ග වල ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය සියයට 85 ක් පැවතුණ නමුත් , එය 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී. සාමාන්‍ය ජනතාව විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග හා අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් අදාල කටයුතු වල ප්‍රගතිය සම්පූර්ණ කිරීම මන්දගාමීව පැවතුණි. | -එම- | -එම- | -එම- |
| (ඇ) | නව පොල්පිටිය ග්‍රිඩ් උපපොල , පාදුක්ක ග්‍රිඩ් උපපොල ඉදිකිරීමේ සහ පන්නිපිටිය උපපොල ඉදිකිරීමේ කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් වි තිබූ නමුත්, මහජන විරෝධතා හේතුවෙන් 2018 අප්‍රේල් 30 දින වන විට වැඩ නිම කල යුතු වුවත්, නව පොල්පිටියේ සිට පන්නිපිටිය දක්වා පාදුක්ක හරහා සම්ප්‍රේෂණ මාර්ග එළීමේ කටයුතු සියයට 85 ක මට්ටමක පැවතුණි. | -එම- | -එම- | -එම- |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ------------------ | ------------ | ---------------- | ------------ |
| ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියළුම ආධාර අරමුදල් සපයන ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ වගකීම දරන අතිරේක සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති) වෙනුවට කොටස් 04 කින් සමන්විත ව්‍යාපෘතියේ අධීක්ෂණය හා මෙහෙයවීම විවිධ අංශ ප්‍රධානීන් යටතේ සිදු කර තිබුණි. | ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද අධීක්ෂණය හා අධීක්ෂණ යාන්ත්‍රණය දුර්වල වූ අතර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. | 2010 අගෝස්තු 25 වන දින මණ්ඩල තීරණයට අනුව පුනරුත්ථාපන ව්‍යාපෘති හැර, සම්ප්‍රේෂණ හා උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් අතිරේක සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති) සතුව වගකීමට බැඳේ. | ව්‍යාපෘතියේ සමස්ථ අධීක්ෂණය හා මෙහෙයවීම කටයුතු සිදු කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයෙකු පත්කල යුතුය. |

## 3.3 පද්ධති හා පාලනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | ------------------ | ------------ | ---------------- | ------------ |
| (අ) | මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සෑම මූල්‍ය වර්ෂයකම මාර්තු මස 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 08 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | ප්‍රධාන අවශයතාවයන් සපුරා නොමැත. | ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අවසන් වනතුරු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සකස් නොකෙරේ. | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) වගන්තියට අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු වාර්තා කිරීම් සඳහා පවත්වා ගත යුතු ලෙජර් ගිණුම ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙන්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ව්‍යාපෘතියේ වියදම් පැහැදිලිව හඳුනාගත නොහැකි අතර ගනුදෙනු වැරදි ලෙස දැක්වීම | එක් එක් පිරිවැය මධ්‍යස්ථාන වල වෙනම ගිණුම් පොත් සහ මූල්‍ය ප්‍රකාශන පවත්වාගෙන යනු | ව්‍යාපෘතියේ ගනුදෙනු වාර්තා කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර් ගිණුම් |

| | | | | |
|---|---|---|---|---|
| | | හෝ මග හැරීම විය හැක. | ලැබේ. | පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි **134(3)** අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටතේ කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනය නිසි ලෙස ක්‍රියාත්මක නොවිය හැක. | සටහන් කර ඇත. කෙසේ වෙතත්, මෙය විෂයපථයෙන් බාහිර වේ. | ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා ව්‍යාපෘතිය විගණනය කල යුතුය. |
| (ඈ) | **2016** අප්‍රේල් **29** දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක: පී.ඊ.ඩී/**03/2016** චක්‍රලේඛයේ දක්වා ඇති නියමයන්ට පටහැනිව ස්වකීය අරමුදල් වලින් උපයන විට බදු **(PAYE)** රු.මිලියන **36.32**ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය අනවශ්‍ය ලෙස වැඩි විය හැක. | භාවිතයක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ උපයනවිට බදු වගකීම මණ්ඩලය විසින්ම දරනු ලැබේ. | උපයන විට බද්ද **(PAYE)** සේවකයින්ගේ වැටුපෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතුය. |